# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 15,009/1 — 1972 මැයි 5 වැනි සිකුරාද — 1972.5.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත

#### 58 (1) වගන්තිය යටතේ නිවේදනය

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 58 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැවිලි කර්මාන්ත ඇමති කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම, මෙම නිවේදනයෙන් පහත සඳහන් දෑ ක්‍රියාත්මක විය යුත්තේ යම් දිනයකදී හා ඉන්පසුවද එම දිනය වශයෙන් 1972 මැයි මස පස් වැනි දින නියම කරමි :—

(1) පොල් නිෂ්පාදන ආඥපනත යටතේ පිහිටුවන ලද ලංකා පොල් මණ්ඩලයේ සහ 1967 අංක 17 දරන පොල් කෙඳි පනත යටතේ පිහිටුවන ලද පොල් කෙඳි මණ්ඩලයේද කටයුතු අතරින් මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කටයුතු පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් සැකසුම් මංඩලය විසින් පවරා ගෙන කරගෙනයාම;

(2) පොල් නිෂ්පාදන ආඥපනත යටතේ පිහිටුවන ලද ලංකා පොල් මණ්ඩලයේ සහ පොල් කෙඳි ආඥපනත යටතේ පිහිටුවන ලද පොල් කෙඳි මණ්ඩලයේ කටයුතු වලින් මෙහි පළමුවන උපලේඛනයෙහි නිශ්චිත කර ඇති කොටස හැර ඉතිරි කොටස පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් අලෙවි මණ්ඩලය විසින් පවරා ගෙන කරගෙනයාම;

(3) පොල් පර්යේෂණ ආඥපනත යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ මණ්ඩලයේ කටයුතු අතරින් මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති කොටස, පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් වගා මණ්ඩලය විසින් පවරා ගෙන කරගෙනයාම; සහ

(4) පොල් පර්යේෂණ ආඥපනත යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ මණ්ඩලයේ කටයුතු වලින් මෙහි දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති කොටස හැර ඉතිරි කොටස පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් පර්යේෂණ මණ්ඩලය විසින් පවරා ගෙන කරගෙන යාම.

#### පළමුවන උපලේඛනය

(1) කපාපු පොල් මෝල් සහ පොල් මෝල් ලියාපදිංචි කිරීම.

(2) කපාපු පොල් මෝල් පරීක්ෂා කිරීම සහ රටේ නිපදවන කපාපු පොල් නියැදි ගැනීම, විද්‍යාත්මක ලෙස පරීක්ෂා කිරීම, තත්ත්වය පාලනය කිරීම සහ කපාපු පොල් නිෂ්පාදනය විධිමත් කිරීම.

(3) පොල් කෙඳි මෝල් සහ පොල් කෙඳි සැකසුම් මෝල් ලියා පදිංචි කිරීම.

(4) පොල් කෙඳි මෝල් සහ පොල් කෙඳි සැකසුම් මෝල් පරීක්ෂා කිරීම, හා සාදන පොල් කෙඳිවල හා සැකසුම් කරන පොල් කෙඳිවල තත්ත්වය පාලනය කිරීම හා නිෂ්පාදනය විධිමත් කිරීම.

(5) පොල් නිෂ්පාදනය සෑදීමේ කර්මාන්තයට කාර්මික සහාය හා උපදෙස් දීමත් උපකරණ හා උපයෝගී ද්‍රව්‍ය සැපයීම.

(6) කපාපු පොල් නිෂ්පාදනයනට මුදලින් ආධාර දීම.

#### දෙවන උපලේඛනය

(1) පොල් වවන්නනට හා පොල් වගාවන්හි වෙනත් බෝග වවන්නනට උපදෙස් දීම සහ ව්‍යාප්ති සේවා සැපයීම.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1972 මැයි 3 දින,
කොළඹ දීය.

5-320/1

## 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත

1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 51 හා 58(3) වන වගන්ති යටතේ වැවිලි කර්මාන්ත ඇමති විසින් පනවන ලද නියෝග.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1972 මැයි 3 දින,
කොළඹදී ය.

### නියෝග

1. මෙම නියෝග 1972 අංක 1 දරන පොල් සංවර්ධන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

2. මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට තුන් මාසයක් වූ හා මෙහි මින් මතු " නියමිත කාලය " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද කාලයකින් පසු, කිසිම තැනැත්තකු පොල්තෙල්, කපාපු පොල් හෝ පොල් කෙඳි මෝල්කරුවකු හෝ සකස් කරන්නකු වශයෙන් ව්‍යාපාරයක් කරගෙන යාම, පොල් සැකසුම් මණ්ඩලය මගින් ඔහු ඒ සඳහා ලියාපදිංචි කරනු ලැබ ඇතිනම් මිස, නොකළ යුතු ය.

එසේ වුව ද, ලියාපදිංචි වීමේ දිනයට පෙරාතුව වූ හය මාසය ඇතුළත තමා විසින් කරන ලද ගනුදෙනු පදනම් කරගෙන ගණන් බලනු ලබන, ව්‍යාපාරික කටයුතුවල දෛනික සාමාන්‍යය, පොල් තෙල් හොණ්ඩර එකකට හෝ පොල් කෙඳි හොණ්ඩර එකකට අඩු වන පොල්තෙල් හෝ පොල්කෙඳි මෝල්කරුවකු හෝ සකස් කරන්නෙකු සම්බන්ධයෙන් වූ විට එවැනි ලියාපදිංචි කිරීමක් අවශ්‍ය නොවිය යුතු ය.

3. නියමිත කාලයෙන් පසු කිසිම තැනැත්තකු—

(1) යම් පොල් නිෂ්පාදනයක් මිලයට ගැනීමෙහි සහ විකිණීමෙහි නියුක්තව සිටින වෙන්දේසිකරුවකු නැතහොත් බ්‍රෝකර් කෙනකු වශයෙන්, හෝ

(2) යම් පොල් නිෂ්පාදනයක් නැව්ගත කරන්නකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙනයාම, පොල් අලෙවි මණ්ඩලය මගින් ඔහු ඒ සඳහා ලියාපදිංචි කරනු ලැබ ඇතොත් මිස නොකළ යුතු ය.

4. නියමිත කාලයෙන් පසු කිසිම තැනැත්තකු, පොල්, කොප්පරා, පොල්තෙල්, පොල් පුන්නක්කු හෝ පොල් කෙඳි වෙළෙන්දෙකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම, ඒ සඳහා ඔහු පොල් අලෙවි මණ්ඩලය මගින් ලියාපදිංචි කරනු ලැබ ඇති නම් මිස, නො කළ යුතුය.

එසේ වුවද, ලියා පදිංචිවීමේ දිනට පෙරාතුව වූ හය මාසය තමා විසින් කරන ලද ගනු දෙනු පදනම් කරගෙන ගණන් බලනු ලබන, ව්‍යාපාරික කටයුතුවල දෛනික සාමාන්‍යය, පොල් ගෙඩි තුන්දහසකට අඩුවන, කොප්පරා හොණ්ඩර දහයකට අඩුවන, පොල්තෙල් හොණ්ඩරයකට අඩුවන, පොල් පුන්නක්කු හොණ්ඩරයකට අඩුවන, හෝ පොල්කෙඳි හොණ්ඩරයකට අඩුවන තැනැත්තකු ඒ ව්‍යාපාරය සඳහා පොල් අලෙවි මණ්ඩලය මගින් ලියාපදිංචි කරනු ලැබීම අනවශ්‍ය විය යුතුය.

5. පොල් අලෙවි මණ්ඩලය විසින් නිකුත් කරන අපනයන බලපත්‍රයක් බලය යටතේ මිස කිසියම් පොල් නිෂ්පාදනයක් ලංකාවෙන් අපනයනය කරනු නොලැබිය යුතුය.

6. සෑම මෝල්කරුවෙකු, නිෂ්පාදකයකු හෝ සකස් කරන්නෙකුම, ඒ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම, ඇහිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හා ඒවාවල තත්ත්වය පිළිබඳව පොල් සැකසුම් මණ්ඩලය විසින් විටින් විට නිශ්චය කරනු ලබන ප්‍රමිති හා වෙනත් නියමයන් පිළිපැදිය යුතුය.

7. කිසියම් පොල් නිෂ්පාදනයක් වෙළඳාම් කරන හෝ නැව්ගත කරන සෑම තැනැත්තකුම ඒ නිෂ්පාදන මිළදී ගැනීම, ඇහිරීම, ගබඩාකිරීම, ප්‍රවාහනය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම සහ එවැනි නිෂ්පාදනවල තත්ත්වය හා මිළ ගණන් පිළිබඳව පොල් අලෙවි මණ්ඩලය විසින් විටින් විට නිශ්චය කරන ප්‍රමිති හා වෙනත් නියමයන් පිළිපැදිය යුතුයි.

8. පනතේ 58(1) වගන්තියේ සඳහන් ප්‍රඥප්ති යටතේ පනවා ඇති අපනයන තීරුබදු වශයෙන් ලැබෙන මුදල් පනතේ 58(1) වගන්තියේ සඳහන් මණ්ඩලවල කටයුතු පවරා ගැනීම සහ කරගෙනයාම සඳහා පිහිටුවා ඇති මණ්ඩල විසින් පොල් සංවර්ධන අධිකාරිය විසින් නිශ්චය කරන පරිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රධාන රේගු අයකැමි විසින් පොල් සංවර්ධන අධිකාරිය වෙත මාස් පතා ගෙවිය යුතුයි.

9. පනතේ 58 (1) වගන්තියෙහි සඳහන් ප්‍රඥප්ති හෝ ඒ ප්‍රඥප්ති යටතේ පනවා ඇති කිසියම් නියෝගයක් යටතේ ගෙවිය යුතු අපනයන බලපත්‍ර ගාස්තු, පනතේ 58 (1) වගන්තිය හා 23(ඌ) වගන්තිය යටතේ අපනයන බලපත්‍ර නිකුත් කිරීම බාරගෙන, එය කරගෙන යන මණ්ඩලයට ගෙවිය යුතුය.

10. මේ නියෝග යටතේ යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම අවුරුද්දක කාලසීමාවක් සඳහා වියයුතු අතර එයින් පසු සෑම අවුරුද්දක් සඳහා ම ඒ ලියාපදිංචි කිරීම අලුත් කරනු ලැබිය හැකිවිය යුතුය.

11. මේ නියෝගවල " පනත " යන්නෙන් 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත අදහස් වේ.

5–320/2

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.